# <u>උඩපළාත ප්‍රාදේශීය සභාව</u>
# <u>2022.10.18 දින ටෙන්ඩර් මණ්ඩල වාර්තාව</u>

- **තීරණ අංක 01**

ගබඩාව සඳහා අවශ්‍ය සෞඛ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට මිල ගණන් කැඳවන ලද අතර එම මිල ගණන් පහත දැක්වේ.

| අනු අං: | විස්තරය | මහනුවර ඒජන්සි | ජයලංකා හාඩ්වෙයාර් | රාජ්‍ය වාණිජ විවිධ නීති. සංස්ථාව (STC) |
|---|---|---|---|---|
| 01 | ඉදල් | 207.00 | 275.00 | --- |
| 02 | උදළු තල 8*10 | 3950.00 (කිඹුලා) | 3860.00 | STC 2100.00 |
| 03 | සොරබ් | 350.00 | 350.00 | --- |

එම මිල ගණන් අනුව අවම මිල යටතේ ඉදල් 01ක් රු.207.00 ටත්, සොරබ් 01ක් රු.350.00 ටත්, මහනුවර ඒජන්සීස් ආයතනයෙන් මිලට ගැනීමටත්, උදළුතලවල අවම මිල සඳහන් STC ආයතනයෙන් එම අයිතම වර්ගය කිඹුලා වර්ගය නොවුව ද අවම මිල යටතේ 01 ක් රු.2100.00 බැගින් මිලට ගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය. (කිඹුලා උදළුතල කුඹුරු කෙටීමට විශේෂ වන අතර කාර්යාලය සඳහා එය කිඹුලා වර්ගයම වීම අවශ්‍ය නැති බව ටෙන්ඩර් මණ්ඩල අදහස විය.)

- **තීරණ අංක 02**

ගබඩාව සඳහා අවශ්‍ය පොදු ද්‍රව්‍ය මිලදී ගැනීමට මිල ගණන් කැඳවන ලද අතර එම මිල ගණන් පහත දැක්වේ.

| අනු අං: | විස්තරය | නිව් ජෙනරල් | රාජ්‍ය වාණිජ විවිධ නී.සං | නදිකාස් | සෙන්ට්‍රල් ස්ටේෂනරිස් | එල්.එච්. චන්ද්‍රසේකර | පේපර්ලයින් පු.ලි |
|---|---|---|---|---|---|---|---|
| 01 | අත් පිස්නා | 115.00 | (24*24)170.00 | (20*20)63.50 | 75.00 | (20*20)107.00 | 119.60 |
| 02 | ඉරේසර් | 25.00 | Atlas 19.01 | 10.00 | Nataraj 18.75 | --- | Atlas 8.63 |
| 03 | පැන්සල් | 32.00 | Atlas - 12 Set 450.00 | 30.00 | Atlas 33.00 | Nataraj 30.00 | Nataraj 23.00 |
| 04 | ස්ටේප්ලර් මැෂින් | Kangaro HD45 675.00 | --- | 75.00 | Kangaro 595.00 | Kangaro HD45 722.25 | Kangaro HD45 736.00 |
| 05 | පන්චර් | Kangaro DP480 548.80 | --- | 600.00 | DP600 Selvo 525.00 | Kangaro DP600 946.95 | Kangaro DP600 966.00 |
| 06 | ගම් බෝතල් (500ml) | Mariss 310.00 | --- | 370.00 | (750.00 ml) 360.00 | (750.00 ml) 398.00 | Mariss 372.60 |
| 07 | කෙම්ෆික්ස් ගම්(250g) | Mariss 286.00 | --- | 660.00 | (300g) 387.00 | 540.00 | 385.25 |
| 08 | TL 410 Pantum ටෝනර් | --- | --- | 44000.00 | (ORG)22000.00 (COM) 9500.00 | --- | (ORG) 22367.50 |
| 09 | Pantum 211 ටෝනර් | --- | --- | 38500.00 | (ORG)10000.00 (COM) 8000.00 | (ORG)9800.00 (COM) 7000.00 | (ORG) 10867.50 |
| 10 | CR පොත් - පිටු 120 | --- | Atlas 353.50 | 280.00 | Atlas 288.00 | Atlas 280.00 | Paperline 263.35 |
| 11 | CR පොත් - පිටු 160 | --- | --- | Atlas 328.00 | Atlas 369.00 | Atlas 335.70 | Paperline 351.90 |
| 12 | ½ සෙලෝටේප් | 25.20 | --- | 77.50 | 25 mts 29.00 | 20 mts 17.12 | 50 mts Azmo 62.10 |
| 13 | හාෆ්ෂීට් | N.G.T 1510.00 | --- | 1450.00 | (No.1) 1750.00 | LHC 1725.00 | A4 MIMA (1725/-) 3.45 |

මේ සඳහා ලද මිල ගණන් අනුව, අවම මිල ගණන් යටතේ අත්පිස්නා 01 ක් රු.63.50 ත්, Atlas වර්ගයේ CR පිටු 160 පොත් 01 ක් රු.328.00 ටත්, No 1 හාෆ්ෂීට් බණ්ඩලයක් රු.1450.00 ටත් නදීකාස් ආයතනයෙන් මිලදී ගැනීමටත්, අවම මිල ගණන් යටතේ කෙමිෆික්ස් ගම් 01ක් රු. 286.00 ට නිව් ජෙනරල් ආයතනයෙන්ද,

Kangaro වර්ගයේ ස්ටේප්ලර් මැෂින් 01ක් රු.595.00 ටත්, පංචර් 01ක් රු.525.00 ටත්, ගම් බෝතල් (500ml) අවශ්‍ය නමුත් මිල ගණන් සලකා බලා (750ml) මිලට ගැනීම වඩා වාසිසහගත බැවින්, 01ක් රු.360.00 ටත්, අවම මිලට original Pantum TL 410 ටෝනර් 01 රු.22000.00 ට සෙන්ට්‍රල් ස්ටේෂනරිස් ආයතනයෙන්ද, Pantum 211 ටෝනර් 01 ක් රු.9800.00 (original) අවම මිලට එල්.එච්.චන්ද්‍රසේකර ආයතනයෙන්ද,

අනෙකුත් අයිතමයන් වන Atlas ඉරේසර් 01ක් රු.8.63 ටත්, Natraj පැන්සල් 01 ක් රු.23.00 ටත්, CR පිටු 120 පොතක් රු.263.35 ටත්, ½ " සෙලෝටේප් (50m ක් දිග)01 ක් රු.62.10 ටත්, අවම මිල ගණන් යටතේ ජේපර්ලයින් ආයතනයෙන්ද මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 03**

කාර්යාලය සහ පුස්තකාලය සඳහා අත්‍යාවශ්‍ය පරිගණක යන්ත්‍රවල Drum Unit ස්ථාපිත කිරීමට Drum Unit මිලදී ගැනීමට මිල ගණන් කැඳවීය.

| අ අං | විස්තරය | ජේපර්ලයින් ට්‍රේඩින් |
|---|---|---|
| 01 | Drum – 01<br>Pantum P3300 DN | 19450.00 (original) |
| 02 | Drum – 02<br>Lexmark MS 310 DN | 34450.00 (original)<br>24450.00 (Astra Brand) |
| 03 | Drum – 03<br>Brother RD 3455 | 49450.00 (original)<br>12450.00(Astra Brand) |

මිල ගණන් ලැබී තිබුයේ ජේපර්ලයින් ආයතනයෙන් පමණකි. එම මිල ගණනට අමතරව වෙනත් ආයතන වලින් තවත් මිල කැඳවීම් කිරීමේදී ගතවන කාලයට සාපේක්ෂව මිල ඉහළයන බැවින් ද, නව ප්‍රින්ටර් ඇතුළු භාණ්ඩ ආනයනය අවම වීමෙන් ප්‍රින්ටර් මිල ඉහළ ගොස් ඇති බැවින් ද, ඩ්‍රම් යොදා භාවිත කළ හැකි ප්‍රින්ටර් නැවත භාවිතය සුදුසු බව කමිටුවේ අදහස වූ අතර එම නිසා, ඉතා හදිසි Pantum ඩ්‍රම් 01ක් මිල කමිටු ආවරණ අනුමැතියට යටත්ව මිලදී ගැනීමට කටයුතු කර ඇති නිසා Lexmark original ඩ්‍රම් 01ක් රු.34450.00 ට ත්, Brother original ඩ්‍රම් 01ක් රු.49450.00 ටත් ජේපර්ලයින් ආයතනයෙන් ගෙන්වීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය තීරණයයි.

- **තීරණ අංක 04**

PF-7352 කැබ් රථයට බැටරියක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීය. මෙහිදී ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සහ ප්‍රදේශයේ ප්‍රසිද්ධ සැපයුම්කරුවන්ගෙන් ද මිල ගණන් කැඳවන ලද්දේ භාණ්ඩ ගෙන්වීම අවම වී ඇති බැවින් සහ සමහර ආයතනවල භාණ්ඩ නොමැති බව පෙර මිල කැඳවීම්වලදී ද දන්වා තිබූ බැවිනි.

| අ අං | විස්තරය | ඉන්ද්‍රා මෝටර්ස් | සිසිර බැටරි | **MJR** | නිපෝන් මෝටර්ස් | ටෙක් මාට් |
|---|---|---|---|---|---|---|
| 01 | 12V, 90AMP Exide බැටරිය (PF-7352 කැබ් රථයට) | 90 AMP<br>57285.00 | 90 AMP<br>50500.00<br>(3 Year war) | 95 AMP<br>48507.00<br>(1 Year war) | 70 AMP<br>51800.00<br>(3 Year war) | 70 AMP<br>51000.00<br>(3 Year war) |

මේ සඳහා ලද මිල ගණන් සියල්ල පරීක්ෂා කර බැලීමේදී **MJR** ආයතනයෙන් අවම මිල ගණන් ලබා දී ඇතත්, අප විසින් ඉල්ලුම් කර ඇති ඇම්පියර් ප්‍රමාණයට සරිලන බැටරියක් නොවීම මෙන්ම, එම බැටරියේ වගකීම් කාලය වසරක් පමණක් වීම මත එම ආයතනයට පසුව අවම මිල සඳහන් වන සිසිර බැටරි ආයතනයේ මිල ගණන පරීක්ෂා කරන ලදී.එම ආයතනයේ මිල ගණන් අනුව, වසර තුනක වගකීම් කාලයක් ලබා දෙන අතරම ඇම්පියර් 90 (90AMP) වර්ගයේ බැටරියක් වීමෙන්ද **MJR** ආයතනයට පසුව සඳහන් අවම මිල

හේතුවෙන් සිසිර මෝටර්ස් ආයතනයෙන් බැටරියක් රු. 50500.00 ට මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය විය.

- **තීරණ අංක 05**

2022-06-21 දින පැවති ටෙන්ඩර් කමිටුවේ තීරණ අංක 06 යටතේ පැවති කාර්යාලය තුළ භාවිත කරන ඡායා පිටපත් යන්ත්‍රයට යොදනු ලබන NPG 73 Canon වර්ගයේ ටෝනර් මිලට ගැනීම නියෝජිත ආයතනයෙන් ම සිදු කිරීම යන්ත්‍රයේ කල් පැවැත්ම, ප්‍රමිතියට හා භාවිතයට සුදුසු වන බවට අදහස් දක්වන ලදි. ඒ අනුව. නියෝජිත ආයතනයෙන් ම NPG 73 Canon ටෝනර් මිලදී ගැනීමට අදාල ආයතනයෙන් මිල ගණන් ලබා ගන්නා ලදි.

| අ අං | විස්තරය | මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් ප්‍ර. ලිමිටඩ් |
|---|---|---|
| 01 | NPG 73 ටෝනර් (Canon වර්ගය) | 94961.25 |

එම මිල ගණන අනුව මෙය නියෝජිත ආයතනයේම මිලදී ගැනීමක් වන බැවින් ද, විමසා බැලීමේදී පිටපත් 40000ට ආසන්නව පිටපත් ගත හැකි බව දන්වා සිටීමෙන් ද, අනෙක් ආයතනවල ටෝනර් ද මේ හා සමාන ඉහළ මිලක් වන බැවින් කාර්යාල භාවිතය සඳහා ඇති ඡායා පිටපත් යන්ත්‍රයට මෙට්‍රොපොලිටන් ආයතනයෙන්ම ප්‍රමිත්යෙන් ඉහළ ටෝනර් 01ක් රු.94961.25 බැගින් මිලදී ගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩල තීරණයයි.( ඡායා පිටපත් යන්ත්‍රය සේ්වා කර ගැනීමටද හැකි වන අතර කාර්යාලය සඳහා අත්‍යාවශ්‍ය යන්ත්‍රයක් වීමෙන් මෙයට ටෝනර් දිගින් දිගටම මෙම ආයතනයෙන් ම මිලදී ගන්නා ලෙසටද උපදෙස් ලබා දෙන ලදි.

- **තීරණ අංක 06**

PF -7352 දරණ කැබ් රථයේ වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා පළාත් සභාවේ ලියාපදිංචිකරුවන්ගෙන්, ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සහ ප්‍රදේශයේ ප්‍රසිද්ධ සේවා සපයන ආයතනයන්ගෙන් මිල ගණන් කැඳවන ලදි.

| අනු අං | විස්තරය | කූල්කෙයා ටෙක්නොලොජීස් |
|---|---|---|
| 01 | PF -7352 කැබ් රථයේ වායුසමීකරණ පද්ධතිය සැකසීම ( කාන්දු පරීක්ෂාව හා නයිට්‍රජන් පීඩනය, වාෂ්පීකරණ හරය ප්‍රතිස්ථාපනය කිරීම, ආරෝපණ රේඛා යලි සැකසීම, නයිට්‍රජන් කාර්යය හා සේවා ගාස්තු සියල්ල) | 65000.00 |

මේ සඳහා ප්‍රාදේශිය සභා සහ පළාත් ලියාපදිංචිකරුවන්ගෙන් මෙන්ම ප්‍රදේශයේ ප්‍රසිද්ධ අලුත්වැඩියා සිදු කරන ආයතනයන්ගෙන් මිල ගණන් කැඳවූ නමුත්, එක් ආයතනයකින් පමණක් මිල ගණන් ලබා දී තිබුණි. එම මිල ගණන අනුව කැබ්රථයේ වායුසමීකරණ පද්ධතිය සකස් කිරීම එම ආයතනයට ලබා දීම සුදුසු බවත්, යළි යළිත් මිල ගණන් කැඳවා කාලය ගත වන තරමට මිල ගණන්ද ඉහළ යන අතර අක්‍රීය වී ඇති වායු සමීකරණ පද්ධතියේ කොටස් ඉක්මනින් ඉවත් කොට අලුත්වැඩියා කටයුතු ඉක්මනින් සිදු කිරීම කැබ්රථයටද සුදුසු බවට අදහස් දැක්වූ බැවින් අදාළ වායු සමීකරණ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු කූල් කෙයාර් ආයතනයෙන් රු.65000.00 ට සිදු කර ගැනීම යෝග්‍ය බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 07**

උඩපළාත ප්‍රාදේශීය සභාව භාරයේ ඇති වාහන සේවා කිරීමේදී එකම සේවා මධ්‍යස්ථානයකින් දිගින් දිගටම සේවා කිරීමේදී ඇතිවන අඩු සැලකිලිමත්භාවය, නිසියාකාරව සේවාවන් සිදු නොකිරීම, දිනෙන් දින මිල ගණන් වැඩිවීම, ආදී හේතු සලකා බලා වාහන සේවා කිරීම සම්බන්ධයෙන් පළාත් සභාවේ සහ ප්‍රාදේශීය සභාවේ ද ලියාපදිංචි ආයතන වැඩි ප්‍රමාණයක් නොමැතිවීම හේතුවෙන් ප්‍රදේශයේ මේ සම්බන්ධව ප්‍රසිද්ධ

ආයතනයන්ගෙන් ද මිල ගණන් ලබා ගැනීමට කටයුතු කරන ලදි. එනමුත්, මේ සඳහා මිල ගණන් ලැබී නොතිබුණි.

<table>
<tr><th>අ අං</th><th>විස්තරය</th><td rowspan="14">මිල ගණන් ලැබී නැත</td></tr>
<tr><td>01</td><td>ඉසුසු කෘෂ කැබ් - CP PB7657</td></tr>
<tr><td>02</td><td>ඉසුසු මෝටර් ලොරි - 43 3382</td></tr>
<tr><td>03</td><td>ෆෝටොන් මෝටර් ලොරි - CP LL7039</td></tr>
<tr><td>04</td><td>ෆෝටොන් මෝටර් ලොරි - CP LL7586</td></tr>
<tr><td>05</td><td>මිට්ෂුබිසි ඩබල් කැබ් - 252 6339</td></tr>
<tr><td>06</td><td>මිට්ෂුබිසි ඩබල් කැබ් - WP PF7352</td></tr>
<tr><td>07</td><td>ෆෝටොන් ජල බවුසරය - CP LL7364</td></tr>
<tr><td>08</td><td>ටැෆේ ට්‍රැක්ටරය - RD 1613</td></tr>
<tr><td>09</td><td>ටැෆේ ට්‍රැක්ටරය - RD 4544</td></tr>
<tr><td>10</td><td>එයිචර් ගාබේජ් කම්පැක්ටරය- ZB 0716</td></tr>
<tr><td>11</td><td>බජාජ් සීටී100 යතුරු පැදිය - CP MO4991</td></tr>
<tr><td>12</td><td>බජාජ් සීටී100 යතුරු පැදිය - CP MO4992</td></tr>
<tr><td>13</td><td>ජෝන් ඩියර් ට්‍රැක්ටරය - CP JP7450</td></tr>
</table>

මේ සඳහා කිසිදු මිල ගණනක් ලැබී නොතිබූ බැවින් වෙනත් ආයතනවලින් අත් මිල ගණන් කැඳවනවාටත් වඩා 2023 වර්ෂයේ මේ සම්බන්ධ ආයතන ලියාපදිංචි කරවා ගැනීමට කටයුතු කළ යුතු බවට ද, අනතුරුව එම ලියාපදිංචිකරුවන්ගෙන් සහ පළාත් ලියාපදිංචිකරුවන්ගෙන් ද ප්‍රදේශයේ මේ සම්බන්ධ යම් ප්‍රසිද්ධ ආයතන වේ නම් ඒවාගෙන් ද මිල ගණන් කැඳවා සභාවෙහි වාහන සේවා කිරීම පිළිබඳ තීරණය කිරීම වඩාත් සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 08**

252-6339 කැබ් රථයේ තවත් කොටස් කිහිපයක් සවි කිරීමට අවශ්‍ය වන බැවින් අත් මිල ගණන් ලබා ගන්නා ලදි.

| අ අං | විස්තරය | විමලරත්න වැල්ඩින් | සෝමසේන මෝටර්ස් | සිරිල් මෝටර්ස් |
|---|---|---|---|---|
| 01 | ඉදිරිපස හා පිටුපස සීට් සහ වින්ඩ්ස්ක්‍රීන් එක සැපයීම | 122,500.00 | 160,000.00 | 154,500.00 |

පෙර අලුත්වැඩියා කටයුතු ද විමලරත්න ආයතනයෙන් සිදු කරන බැවින් ද, අවම මිල ගණන් ඉදිරිපත් කිරීම හේතුවෙන් ද සීට් හා වින්ඩ්ස්ක්‍රීන් සවි කිරීම විමලරත්න ආයතනයෙන් රු. 122,500.00 ට සිදු කිරීම යෝග්‍ය බවට ටෙන්ඩර් මණ්ඩල තීරණයයි.

**<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

01. ඩී.ජී. ගුණසේන මයා - ගරු සභාපති
02. අසේල අමරසේන මයා - ගරු උප සභාපති
03. ජයන්ත කීර්තිසිංහ මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. ශාන්ත නවරත්න මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. ඒ.එච්.ඒ.රත්නායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. හේමකුමාර නයනානන්ද මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. මංජුල දිසානායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. රන්ජන් රාජපක්ෂ මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
09. තංගවේලු කාමරාජන් මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. ඩිමෝෂි වෙලපලාගම මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
11. කෝකිලා වරාහේන මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි

ජී.ආර්.වී.එල්. මැණිකේ මිය - ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරී
ඩබ්.එන්. පොඩිමැණිකේ මිය - සංවර්ධන නිලධාරී

සකස් කළේ: ..…………..…..…… පරීක්ෂා කළේ: …………………....
සභාපති / ලේකම්: …………..............